**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රිකය**
**----------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 23 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය.**
**-------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**
**-----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**-------------------------**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදා ගෙන තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.**
**------------------------**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු රු.715,550 ක් වටිනා CP-RA-4176 ට්‍රැක්ටර් රථයක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 02 කදි වෙන්දේසි කරන ලද රු.107,160 ක් වටිනා ලී බඩු හා කාර්යාල උපකරණවල එක් එක් විෂයයේ පිරිවැය හඳුනා ගෙන අදාළ වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රු.10,225 කට වෙන්දේසි කරන ලද අත් උපකරණවල පිරිවැය හඳුනා ගෙන එම වටිනාකම් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.22,269 ක කඩ කුළී, ඉදිරියට ලැබීම් වශයෙන් ගිණුමට බැර කර, හිඟ කඩ කුළී ගිණුමට හර කර තිබුණි.

(ඉ) සභාව සතු සකළ කරත්ත 06 කින් කසළ කරත්ත 04 ක වටිනකම හදුනා ගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ ආයුර්වේද සංස්ථාවෙන් සභාව වෙත ලැබී තිබුණු බෙහෙත් ද්‍රව්‍ය තොගයේ වටිනාකම ගණනය කර, ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්.**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමෙහි රු.15,383 ක බැර ශේෂයක් පැවතුණු අතර, එම ශේෂය සොයා බලා, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 06 ක අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.38,583,215 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.543,590,000 ක් වූ ඉඩම් 79 ක හිමිකම් ඔප්පු හෝ පැවරුම් නියෝග සභාව සතුව නොපැවතුණු අතර, ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කර ද නොතිබුණි.

**1.3.5 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.**

**පහත සඳහන් නීති, රීති හා රෙගුලාසීවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.**

| | නීති, රීති හා රෙගුලාසී යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය | |
| | මූ.රෙ.351 | වසර 04 කට වඩා පැරණි රු.76,599 ක් වටිනා අගරු චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසී ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරියේ (සැලසුම් හා ගොඩනැගිලි) අංක 392/9 හා 935/6 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයන්හි සඳහන් නියෝගයන් හා විධිවිධාන. | i. අනු බෙදීම් කරන ලද ඉඩම් 25 කට අදාළ සැළැසුම් අනුමත කර නොගෙන අනවසරයෙන් අනු බෙදීම් කර තිබුණි.<br>ii. අනු බෙදීම් කර තිබූ ඉඩම් 06 ක පොදු පහසුකම්වලට අදාළ ඉඩම් කොටස්වල හිමිකම් ඔප්පු පැවරුම් නියෝග සභාවට ලබාගෙන නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය.**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.81,885,063 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.49,292,516 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.32,592,547 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 2.2 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

### 2.2.1 (අ) ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2014.01.01ට හිඟය | වර්ෂයේ බිල් කළ ආදායම | එකතු කළ ආදායම | | 2014.01.01 ට හිඟ හිටි ශේෂයෙන් අය නොවූ ප්‍රමාණය | 2014 බිල්කළ ආදායමෙන් අය නොවූ ප්‍රමාණය | මුළු අය කලයුතු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| | | | 2014.01.01 දිනට හිඟයෙන් එකතු කළ ආදායම | 2014 වර්ෂයේ බිල් කළ ආදායමෙන් එකතු කළ ආදායම | | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,173,240 | 7,280,448 | 4,069,832 | 3,549,024 | 2,103,408 | 3,731,424 | 5,834,832 |
| අක්කර බදු | 75,663 | 7,680 | 104 | 1,569 | 75,559 | 6,111 | 81,670 |
| බලපත්‍ර ගාස්තු | - | - | - | - | - | - | - |
| කසළ බදු | 912,687 | 1,800,000 | 236,380 | 1,715,863 | 676,307 | 84,137 | 760,444 |
| කඩ කුලී | 848,586 | 3,211,008 | 757,623 | 2,971,467 | 90,963 | 239,541 | 330,504 |
| ත්‍රීරෝද ගාස්තු | 1,949,994 | 613,800 | 359,843 | 263,805 | 1,590,151 | 349,995 | 1,940,146 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.36,689,798 ක මුළු ආදායමක් හිඟව තිබුණි.

### 2.2.2 වරිපනම් බදු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.6,173,240 ක හිඟ ශේෂයෙන් රු.4,069,832 ක් අය කර ගෙන තිබුණු අතර, බිල් කිරීම්වලින් අය කිරීම් රු.3,549,024 ක් වූයෙන්, වර්ෂයේ හිඟයෙන් හා බිල් කිරීම්වලින් අය කිරීමේ ප්‍රතිශතය සියයට 57 ක් වී තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට අය වියයුතු රු.5,834,832 ක ශේෂයෙන් 2015 ජූනි 30 දිනට තවදුරටත් රු.4,760,756 ක ශේෂයක් අය වියයුතුව තිබුණ නමුත්, ඒ සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) හා 159(1) වගන්තිවල විධිවිධාන අනුගමනය කර, හිඟ ආදායම් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගිණුමට අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වරිපනම් බදු ශේෂය රු.5,834,832 ක් වූ අතර, සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ශේෂය රු.5,029,615 ක් වූයෙන්, රු.805,217 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.3 කසළ බදු.**

**------------**

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.912,687 ක හිගයක් පැවති අතර, වර්ෂය අවසානයේ එයින් රු.760,444 ක් හිග හිට තිබුණි. ඒ අනුව, අයවීමේ ප්‍රතිශතය සියයට 31 ක තරම් දුර්වල මට්ටමක පැවතුණු අතර, එම මුදල් අය කර ගැනීමේ විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

**------------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.610,580 ක් හා මුද්දර ගාස්තු රු.27,131,620 ක් ලැබියයුතුව පැවතුණි. මෙම ශේෂයෙන් 2015 ජූනි 30 දිනට මුද්දර ගාස්තු රු.574,873 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

**2.2.5 වෙනත් ආදායම්**

**-------------------**

නාගරික සංවර්ධන අධිකාරියේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ගැසට් නිවේදනය අනුව, අනුකූලතා සහතිකය නොමැතිව පදිංචිවීම හෝ භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතු අතර, එම උපදෙස් උල්ලංඝනය කරනු ලබන්නේ නම්, එක් දිනකට රු.50 ක් බැගින් ගාස්තු අය කළයුතු විය. නේවාසික හා ව්‍යාපාරික ස්ථාන 33 ක අනුකූලතා සහතික නොමැතිව පදිංචි වී තිබුණු අතර, ඒ වෙනුවෙන් රු.1,479,000 ක මුදලක් ගාස්තු හා දඩ අය කළයුතු නමුත්, එම මුදල් සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විටත් අය කර ගෙන නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**---------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**----------------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වසර 04 – 15 ත් අතර කාලයක සිට උපලබ්ධි නොවී පවතින රු.274,729 ක් වටිනා බැංකු තැන්පතු, රු.622,564 ක් වටිනා හඳුනා නොගත් බැර අයිතම 108 ක් සහ රු.872,031 ක් වටිනා හඳුනා නොගත් හර අයිතම 39 ක් පිළිබඳව සොයා බලා ඒවා හඳුනා ගෙන සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සභා බල ප්‍රදේශයේ අනවසර ඉදි කිරීම් 23 ක් සම්බන්ධව ලිඛිත නියෝග හෝ උපදෙස් ලබා දි තිබුණ ද, එම උපදෙස් හෝ නියෝග ක්‍රියාත්මක වී තිබුණේද යන්න පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. අනවසර ඉදි කිරීම් නීත්‍යානුකූල කිරීමේ දි, අය කළයුතු අනවසර ගාස්තු අය කිරීමටද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

**---------------------------------**

**මහජන වැසිකිළිය නඩත්තුව**

**--------------------------------**

සභාවට අයත් මැණික්හින්න නගරයේ මහජන වැසිකිළියේ නඩත්තුව හා භාවිතා කරන්නන්ගෙන් ගාස්තු අය කිරීම ටෙන්ඩර් පරිපාටියකින් හා ගිවිසුමකට එළඹීමකින් තොරව බාහිර පුද්ගලයෙකු වෙත පවරා තිබුණි. එම පාර්ශවය විසින් භාවිතා කරන්නන්ගෙන් රු.5 ක් හා රු.10 ක් බැගින් මුදල් අය කරමින් පවතින නමුත්, මහජන වැසිකිළියේ නඩත්තුව පවරා දුන් දින සිට විගණන දින වු 2015 අප්‍රේල් 20 දක්වා කිසිදු ආදායමක් සභාවට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එහි ජල

පරිභෝජනය වෙනුවෙන් රු.141,584 ක් සහා අරමුදලින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ගෙවා තිබුණි.

**3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

--------------------------------------------

රු.4,862,120 ක් වටිනා ජල උපකරණ, විදුලි උපකරණ හා වටිනාකම හඳුනා ගෙන නොතිබුණු රථ වාහන 02 ක් වර්ෂ 03 කට වැඩි කාල සීමාවක සිට නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතින.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය.**

--------------------------

**(අ) ප්‍රජාපාදක සංවිධාන සඳහා ඍජු කොන්ත්‍රාත් පැවරීම.**

---------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පාරිපාලන) රීති මාලාවේ 177 හා 178 ප්‍රකාරව ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමකින් තොරව සභා අරමුදලින් (නිර්මාණ වැඩ ඇතුළුව) කර්මාන්ත 140 ක් ප්‍රජාපාදක සංවිධානයන්ට පවරා රු.11,565,431 ක් ගෙවීම් කර තිබුණි.

(ii) 2012 ජනවාරි 05 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2012 අනුව, ප්‍රජාපාදක සංවිධානවලට කොන්ත්‍රාත් පැවරීමේ දී, අදාළ ප්‍රජාපාදක සංවිධානය කොන්ත්‍රාත් 03 කට වඩා වැඩි කොන්ත්‍රාත් ප්‍රමාණයක නිරත වී නොසිටියයුතු වුව ද, කුණ්ඩසාල විවිධ සේවා සමූපකාර සමිතිය වෙත 2014 වර්ෂයේ රු.32,653,696 ක් වටිනා කර්මාන්ත 81 ක් වර්ෂය තුළ පවරා රු.28,772,680 ක් ගෙවා තිබුණි.

**(ආ) ප්‍රතිපූර්ණය නොවූ අරමුදල්**

-----------------------------

වැඩ අවසන් කර්මාන්ත 18 ක් සඳහා මුදල් ප්‍රතිපූර්ණය වීමට පෙර සමාලෝචිත වර්ෂයේදී රු.9,458,183 ක් සභා අරමුදලින් ගෙවීම් කර තිබුණ ද, 2015 මැයි 20 දින වන විටත් එම මුදලින් රු.7,212,217 ක මුදලක් තවදුරටත් ප්‍රතිපූර්ණය වී නොතිබුණි.

**(ඇ) එස්.බී. වීරකෝන් මාවත සංවර්ධනය කිරීම - වැය කළ මුදල රු.1,467,035**

------------------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1:2:4 (19mm) කොන්ක්‍රීට් මිශ්‍රණය යොදා ඉදි කිරීමට ඇස්තමේන්තු කරන ලද කොන්ක්‍රීට් මාර්ග තලය ස්ථාන කීපයක් කඩා පරීක්ෂා කිරීමේ දී, එම ස්ථාන පහසුවෙන් අතින් කැඩිය හැකි මට්ටමේ දුර්වල කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදා තිබුණි. කොන්ක්‍රීටයේ දෙපස මී වද (Honey Comb) ලක්ෂණ දක්නට ලැබුණු අතර, කොන්ක්‍රීට් මාර්ග තලය ආරම්භයේ සිට අවසානය දක්වා බොහෝ ස්ථානවල පුපුරා ඉරී තලා තිබුණි. තව ද, එම පිපිරුම්වලින් සමහරක් අගල් ½ ක පමණ විවරයකින්යුතු විශාල පිපිරීම් තිබූ බව 2015 අප්‍රේල් 20 දින කරන ලද භෞතික පරීක්ෂණයේදී අනාවරණය විය.

(ii) ඇස්තමේන්තු ප්‍රකාරව ගෙවීම් බිල්පත් අනුව, මාර්ග තලයේ හඳුනාගත් ස්ථානවල ABC මිශ්‍රණය අතුරා ඇති බව දක්වා ඇතත්, ABC මිශ්‍රණය යොදන ලද ස්ථානයේ මිනුම් දක්වා නොතිබීම හේතුවෙන්, ඒවා යොදා ඇති බවක් සනාථ කිරීමට නොහැකි විය.

**(ඈ) ප්‍රජාශාලාව අසළින් යන මාර්ගය ඉදි කිරීම - වැය කළ මුදල රු.689,500**

**------------------------------------------------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අගල් 04 ක් ඝනකමට යෙදියයුතු කොන්ක්‍රීට් මාර්ග තලයේ ස්ථාන කීපයක් කඩා පරීක්ෂා කිරීමේ දි එහි ඝනකම අගල් 3 ½ ක් බව නිරීක්ෂණය වූ අතර, 1:2:4 (19mm) කොන්ක්‍රීට් මිශ්‍රණය යොදා ඉදි කිරීමට ඇස්තමේන්තු කරන ලද කොන්ක්‍රීට් මාර්ග තලය පහසුවෙන් අතින් කැඩිය හැකි මට්ටමේ දුර්වල කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදා තිබූ බව 2015 අප්‍රේල් 20 දින කරන ලද භෞතික පරීක්ෂණයේදී දක්නට ලැබුණි. කොන්ක්‍රීටයේ දෙපස මී වද (Honey Comb) ලක්ෂණ දක්නට ලැබුණි. කොන්ක්‍රීට් මාර්ග තලය ආරම්භයේ සිට අවසානය දක්වා බොහෝ ස්ථානවල පුපුරා ඉරි තලා ගොස් තිබූ අතර, එම පිපිරුම්වලින් සමහරක් අගල් ½ ක පමණ විවරයකින්යුතු විශාල පිපිරීම් ලෙස නිරීක්ෂණය විය.

(ii) ඇස්තමේන්තු ප්‍රකාරව හා ගෙවීම් බිල්පත් අනුව මාර්ග තලයේ හඳුනාගත් ස්ථානවල ABC මිශ්‍රණය කියුබ් 10 ක් යොදා ඇති බව දක්වා ඇතත්, මිශ්‍රණය යොදන ලද ස්ථානයේ මිණුම් දක්වා නොතිබීම හේතුවෙන්, ඒවා යොදා ඇති බවක් සනාථ කිරීමට නොහැකි විය.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**---------------------------------------**

**4.1 ප්‍රසම්පාදන සැළැස්ම.**

**-----------------------**

රු.227,004,399 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.2 අයවැය පාලනය.**

**-------------------**

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අය වැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි, ආදායම් විෂයයන් 03 ක සියයට 33 සිට සියයට 82 දක්වා ද, වියදම් විෂයයන් 07 ක සියයට 20 සිට සියයට 94 දක්වා ද විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අය වැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව විගණනයේ දි නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලනය.**

**---------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරණු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය

(ඉ) වත්කම් කළමනාකරණය